# පුද්ගලික විශේෂිත ප්‍රතිචක්‍රීය ණය ("PERC") සඳහා පොදු නීතිරීති සහ කොන්දේසි

HSBC

PUBLIC

Should you require a translated copy of this document in Sinhala or Tamil languages, please visit www.hsbc.lk or request it from any one of our branches.

මෙම ලේඛනයේ ඉංග්‍රිසි හෝ දමිළ භාෂා පරිවර්තනයක පිටපතක් ඔබට අවශ්‍ය වේ නම්, කරුණාකර අපගේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න, නැතිනම් අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලා සිටින්න.

இந்த ஆவணத்தின் ஆங்கில மற்றும் சிங்கள மொழிபெயர்ப்பு தேவைப்படின் தயவுசெய்து www.hsbc.lk என்ற எமது இணையத்தளத்தை நாடவும் அல்லது எமது கிளை ஒன்றில் கேட்டுப் பெறவும.



PUBLIC

# නීතිරීති සහ කොන්දේසි

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් ශ්‍රී ලංකා ශාඛාව (මින් මතුවට **'බැංකුව'** යනුවෙන් හඳුන්වනු ලබන), විසින් මා වෙත පුද්ගලික සුවිශේෂී චක්‍රීය ණය පහසුකම (මින් මතුවට **'PERC පහසුකම'** යනුවෙන් හඳුන්වනු ලබන) සැපයීම සලකා බලමින්, ගැනුම්කරු වන මම මෙමගින් පහත දැක්වෙන නීතිරීති හා කොන්දේසි භාරගෙන ඊට එකඟ වී සිටිමි:

1. බැංකුව විසින් PERC පහසුකම මා වෙත ලබා දෙනුයේ, අභ්‍යන්තර ණය තොරතුරු සත්‍යාපනය කිරීමෙන් අනතුරුව සහ බැංකුව විසින් PERC පහසුකම අනුමත කිරීමෙන් අනතුරුව බවට මම පිළිගනිමි.

2. PERC පහසුකම් සඳහා වන පොලිය කලින් කලට වෙළඳපොළ පොලී අනුපාතවලට අනුව බැංකුව විසින් තීරණය කරන පරිදි වෙනස්වීමට යටත් වන බවට ද මාගේ PERC ගිණුමෙන් පිරිවැටුම් බදු හා ඒ මත ඇති වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් ද සමඟ හර කළ යුතු වන බවට ද මම එකඟ වෙමි

3. PERC පහසුකම මත වන පොලිය පහත දැක්වෙන ආකාරයෙන් අය කෙරෙනු ඇති බවට මම එකඟ වෙමි:
    - PERC පහසුකම (කලින් කලට වෙනස්වීමට යටත් වන) සඳහා අදාළ වන අනුපාතයට අනුව හිඟ ශේෂය මත සෑම මසකම 19 වන දින දක්වා ගණනය කර පොලිය අය කෙරෙනු ඇති අතර, සෑම මසකම 20 වන දින හෝ බැංකුවෙහි අවශ්‍යතාව අනුව තීරණය කරනු ඇති කාලාන්තරයන් හි දී, ඔබ වෙත දැනුම් දීමක් සහිතව හෝ PERC ගිණුමෙන් හර කෙරෙනු ඇත

4. පොලිය, වියදම් හා බැංකුවේ අවශ්‍යතාවලට හා කලින් කලට බලපවත්වනු ඇති ස්ථාවර රෙගුලාසිවලට අනුකූලව අය කෙරෙනු ඇති වෙනත් යම් ගාස්තු ද ඇතුළත්ව සියලු ම හිඟ මුදල් පළමු ඉල්ලීමේ දී ම බැංකුව වෙත ගෙවීමට මම භාරගනිමි. බැංකුව වෙත ඇති මාගේ සියලුම වගකීම් පියවන ලෙස ඉල්ලා සිටීමට ද, එම පියවර සඳහා හේතු දැක්වීමට හෝ සාධාරණීකරණය කිරීමට බැඳී සිටීමකින් තොරව, තැපැල් මගින් හෝ බැංකුවට සුදුසු යැයි හැගෙන වෙනත් ඕනෑම සන්නිවේදන නාලිකාවකින් /මාර්ගයකින් මා හට දින දාහතරක (14) පූර්ව ලිඛිත දැනුම්දීමක් භාරදීම මගින්, සිය අභිමතය පරිදි මට ලබා දෙන ලද PERC පහසුකම සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට ද (මෙහි පවතින නීතිරීති හා කොන්දේසි කඩකිරීම සම්බන්ධව හෝ වෙනත් කරුණක් සඳහා) බැංකුවට විකල්පය පවතිනු ඇත.

5. සෑම මසක ම 20 වන දින හෝ බැංකුව විසින් නිශ්චය කරන වෙනත් යම් කාලසීමාවක සිට ලිත් දින 20ක් වන ආපසු ගෙවීමේ කාලසීමාවේ දී PERC පහසුකම සඳහා අවම වශයෙන් හිඟ ශේෂයෙන් 5%ක් හෝ (ප්‍රකාශ කරන පරිදි) ඊට වැඩි මුදලක් (මූලික මුදල සහ පොලිය) යන මුදලින් වැඩි මුදල බැංකුව වෙත ගෙවීමට මම එකඟ වෙමි.

6. PERC පහසුකම පිළිබඳ සීමාව ඉහළ දැමීම සඳහා වන හැසිරවීමේ ගාස්තුව හෝ වෙනත් යම් අදාළ ගාස්තුවක් PERC ගිණුමෙන් හර කෙරෙන බවට ද එය ගිණුම් ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇති බවට ද මම එකඟ වෙමි.

7. ගෙවීමේ කාලසීමාවෙහි දී ගෙවිය යුතු අවම මුදල ගෙවීමට මා අසමත් වුවහොත්, බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි දක්වනු ඇති බැංකුවේ ගාස්තු ලේඛනයට අනුව ප්‍රමාද ගෙවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇති බවට ද, එය PERC ගිණුමෙන් හර කෙරෙනු ඇති බවට ද මම භාරගෙන සිටිමි

8. මාගේ PERC ගිණුමෙන් හර කෙරෙන සියලුම පොලී, කොමිස්, වියදම් හෝ ගාස්තු මුදල් බැංකුව වෙත පවතින මාගේ වගකීමෙහි කොටසක් වනු ඇති බවට මා භාරගන්නා අතර, එම මුදල් මාගේ PERC ගිණුමෙන් හර කිරීම මඟින් අයිරා සීමාව හෝ බැංකුව විසින් එහි අභිමතය පරිදි නියමකර ඇති වෙනත් යම් සීමාවක් හෝ ඉක්මවීම සිදුවන්නේ නම්, එම අතිරේක මුදල වහාම ආපසු ගෙවීමට මම භාරගනිමි.

9. මාගේ PERC ගිණුම/ගිණුම් වල පවතින කිසියම් බැර ශේෂයක් සම්බන්ධයෙන්, නිශ්චිත මුදල් හෝ ගිණුම/ගිණුම් සම්බන්ධයෙන් කලින් කලට ලිඛිතව එකඟ වනු ඇති ආකාරයකින් හැර, මෙම PERC පහසුකම පවතින කාලසීමාව තුළ කිසිදු පොලියක් මා වෙත ගෙවීමට නොමැති බවට මම එකඟ වෙමි.

10. කිසියම් ගෙවුම් නියමයකට ගරු කළහොත් එමගින් PERC ගිණුමට / ගිණුම් වලට අවසරලත් සීමාව ඉක්මවා යාමක් සිදුවීමට හැකි නම්, එයට ගරු කිරීමට බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ හැකි බව මා දනිමි. එවැනි ගෙවුම් නියමයක් ප්‍රතික්ෂේප කර ඇති බව මා වෙත දැනුම්දීමට බැංකුව වෙත කිසිදු බැඳීමක් නොපවතී. බැංකුව විසින් හෝ එහි කිසියම් නිලධාරියෙකු විසින් හෝ පිරිනමා ඇති කිසිදු දීර්ඝ කිරීමක්, අයිතීන් අතහැරීමක් හෝ අනුග්‍රහයක් හේතුවෙන් මේ යටතේ බැංකුවට ඇති අයිතීන්ට අගතියක් සිදු නොවනු ඇත. අවසරලත් සීමාව ඉක්මවා ගිය අවස්ථාවක දී, යම් අතිරික්තයක් මෙම ගිවිසුමෙහි නීතිරීති සහ කොන්දේසි වලට යටත් වන බවට මම පිළිගනිමි.

11. බැංකුවේ දී ගෙවිය යුතු ලෙස නියම කළ අයිතමයක් ද ඇතුළත්ව බැංකුව විසින් මාගේ PERC ගිණුම / ගිණුම් වෙත බැර කරන යම් අයිතමයක් සාමාන්‍ය මාර්ගගතයන් ඔස්සේ නිශ්කාශනයට යටත් වන බවට මා එකඟ වෙමි. අයිරා පොලිය ගණනය කිරීමේ දී එසේ බැර කරන ලද එම අයිතම නිශ්කාශනය කෙරෙන තෙක් එම අයිතමවල වටිනාකම බැහැර කිරීමට බැංකුවට අයිතිය පවතී.

12. මෙම PERC පහසුකමට අදාළ ව බැංකුව විසින් මා වෙත ලබාදීමට අදහස් කරන කිසියම් හිමිකම් පෑමක්, කැඳවීමක්, උපදෙසක් හෝ දැන්වීමක්, බැංකුව විසින් අවසානයට දන්නා ලද මාගේ ලිපිනය වෙත තැපෑලෙන් ලිඛිතව හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/මාධ්‍යයක් හරහා හෝ ලබා දී ඇත්නම් මා වෙත නිසි ලෙස ලබා දී ඇති බවට මම එකඟ වෙමි. පොලී අනුපාත වෙනස්වීම පිළිබඳ නිවේදන, ලිපියක් මගින්, සහ/හෝ PERC ගිණුමට අදාළ ප්‍රකාශන පණිවුඩයක් මගින්, සහ/හෝ බැංකු පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීම මගින්, සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk ප්‍රදර්ශනය කිරීම මගින්, සහ/හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/මාධ්‍යයක් හරහා හෝ ලබාදිය හැකිය.

13. බැංකුව වෙතින් ලැබෙන ගිණුම් ප්‍රකාශන ප්‍රවේශමෙන් පරීක්ෂා කර බැලීමට මම භාරගෙන සිටිමි. බැංකුවේ වාර්තාවල සඳහන් වන ආකාරයට මාගේ ලිපිනයට තැපැල් මගින් හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/මාධ්‍යයක් හරහා හෝ ගිණුම් ප්‍රකාශනයක් යැවීමේ දිනයේ සිට මාසයක කාලයක් ඇතුළත බැංකුව වෙත මා වෙතින් කිසිදු විරෝධතාවක් නොලැබුණහොත්, එහි දැක්වෙන ශේෂය නිවැරදි ලෙස සැලකෙනු ඇති අතර, මා වෙතින් කිසිදු සන්නිවේදනයක් ලැබී නැතැයි යන කරුණ PERC ගිණුමෙහි නිවරද්‍ය භාවය තහවුරු කිරීමක් ලෙස අර්ථනිරූපනය කෙරෙනු ඇති අතර, එවැනි ගිණුම් ප්‍රකාශනයක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු විරෝධතාවක් නොදැක්විය යුතු ය.

14. බැංකුව විසින් යම් අවස්ථාවක දී ඉල්ලා සිටින්නේ නම්, මා විසින් බැංකුව වෙත උකස් සුරක්ෂිතයක් තැබිය යුතු අතර, දැන් හෝ අනාගතයේ දී හෝ මාගේ නමින් පවතිනු ඇති සියලුම මුදල්, කොටස්, බැඳුම්කර හා වෙනත් වටිනා ලේඛන බැංකුවෙහි නියමය මත බැංකුවෙහි තැන්පත් කරනු ඇත. බැංකුව විසින් එහි තනි අභිමතය පරිදි මා විසින් මෙම PERC පහසුකම යටතේ හෝ වෙනත් බැංකු පහසුකමක් යටතේ පොලී, ගාස්තු හා වියදම් ද ඇතුළත්ව බැංකුව වෙත ණය ව සිටින සමස්ත මුදල පියවීම සඳහා ඒවා සුරක්ෂිතයක් ලෙස සලකනු ඇත.

15. බැංකුවෙහි භාරයේ හෝ පාලනයෙහි පවතින මා හට අයත් දේපල, අයිතිවාසිකම් හා පොලී මත බැංකුවට ලියමක් හෝ පියවා ගැනීමේ අයිතියක් (හෝ ඊට සමාන අයිතියක්) පවතින බවට මා වැඩිදුරටත් එකඟ වී සිටින අතර, බැංකුව විසින් එම අයිතීන් ක්‍රියාවෙහි යෙදවිය හැකි අතර, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී දැනුම්දීමකින් තොරව මාගේ නමින් පවතින ඕනෑම ගිණුමක් හෝ ගිණුම් සියල්ල ඒවා කවර ශීර්ෂයක් යටතේ පැවතිය ද ඒ බව නොතකා සම්බන්ධකර ඒකාබද්ධ කිරීම සහ/හෝ ජංගම ගිණුමක් හෝ තැන්පතු ගිණුමක් වුවද බැංකුවේ කිසියම් කාර්යාලයක දී මාගේ ගිණුමට යම් අවස්ථාවක දී බැංකුව විසින් නියම කර ඇති කවර මුදල් වර්ගයකින් පැවතිය ද, එම මුදල් සියල්ලම හෝ කිසියම් මුදලක් යොදවා PERC පහසුකමෙහි හිඟ ව ඇති සම්පූර්ණ ශේෂය එමඟින් පියවීම කළ හැකිය.

16. ඔබේ බැංකුව වෙත ඇති මෙම අධිකාරී බලය අවලංගු කළ නොහැකි බවට ද බැංකුවෙහි කැමැත්ත සහිතව අවලංගු කරන තෙක් පූර්ණ වශයෙන් බලාත්මකව පවතිනු ඇති බවට ද මා මෙමඟින් ප්‍රකාශ කර සිටිමි. මීට පටහැනිව යම් ලිඛිත හෝ වෙනත් නීතියක හෝ ගිවිසුමක හෝ මින් අනතුරුව මා විසින් හෝ බැංකුව විසින් හෝ සකස් කළ හෝ සකස් කරනු ඇති ලියැවිල්ලක කිසිවක් සඳහන්ව තිබුණ ද ඒ බව නොතකා, මා වෙත පූර්ව දැනුම්දීමක් නොකර සහ හිඟව පවතින මුදල් බැංකුවට ගෙවන ලෙස මා වෙතින් කිසිදු පූර්ව ඉල්ලා සිටීමක් නොමැතිව බැංකුවට ඕනෑම අවස්ථාවක දී සහ සියලුම අවස්ථාවල දී අත්පත් කරගැනීමේ අයිතිවාසිකම ක්‍රියාවේ යෙදවීමට බලය හා අවසරය පවතිනු ඇත.

17. හිඟව පවතින සහ මා විසින් බැංකුව වෙත ගෙවිය යුතු මුදල සම්බන්ධව බැංකුවෙහි නිලධාරියෙකු විසින් ලබාදෙන සහතිකයක් හිඟ ව පවතින සහ ගෙවිය යුතු සත්‍ය මුදල සම්බන්ධයෙන් සියලුම අරමුණු සඳහා ප්‍රමාණවත් හා අවසානාත්මක සාක්ෂියක් වනු ඇති බවට මා එකඟ වෙමි.

18. PERC පහසුකමෙහි කිසියම් අවලංගු කිරීමක් සහ/හෝ අය කරගැනීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් පූර්ණ හානිපූරණ පදනමක් මත නෛතික ගාස්තු ද ඇතුලුව දරනු ලබන සියලු ගාස්තු, අයකිරීම් සහ වියදම් සඳහා මා විසින් වගකියන බවට මම එකඟ වෙමි.



PUBLIC

19. PERC ගිණුම සඳහා මාගේ/අපගේ මාසික වැටුප සහ ස්ථිර දීමනා අඛණ්ඩව ප්‍රේෂණය කරනු ලබන බවට මම විසින් මෙයින් සහතික වී සිටිනු ලබන අතර, බැංකුවෙන් ලැබෙන පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව මෙම වැඩපිළිවෙල වෙනස් කරනු නොලබන බවට මම එකඟ වෙමි.

20. PERC පහසුකම යටතේ හිඟව පවත්නා සියලු මුදල් අයකර ගැනීම සඳහා තුන්වන පාර්ශ්ව එකතු කිරීමේ නියෝජිතයන් පත්කිරීම සඳහා මා විසින් එකඟ වී බැංකුව වෙත මෙයින් බලය පවරමි. ගෙවීම බලාත්මක කරවා ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට හෝ අවශ්‍ය වුවහොත් පොලිය සමඟ හිඟ මුදල් එකතු කිරීම සඳහා දරන ලද සියලු පිරිවැය ගෙවීමට මම එකඟ වෙමි.

21. PERC පහසුකම පාලනය කෙරෙන මෙම නීතිරීති හා කොන්දේසි (“**නීතිරීති හා කොන්දේසි**”), මෙම අයදුම්පත පිළියෙල කරන අවස්ථාවේදී මා වෙත පැහැදිලි කරන ලද බවත්, නීතිරීති වල අඩංගු විධිවිධාන මා සම්පූර්ණයෙන්ම අවබෝධ කරගත් බවත්, සහ නීතිරීති සහ කොන්දේසි වලින් මා බැඳී සිටීමට එකඟ වන බවත් මම වැඩිදුරටත් තහවුරු කරමි. එකී නීතිරීති සහ කොන්දේසි වල පිටපතක් මා වෙත ලබාදුන් බව සහ බැංකුවේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙතින් එකී නීතිරීති සහ කොන්දේසි වල පිටපතක් ලබාගත හැකි බවත්, සහ/හෝ එහි පිටපතක් බැංකුවේ ඕනෑම ශාඛාවකින් ලබාගත හැකි බවත් මම තහවුරු කරමි.

22. මෙම නීතිරීති හා කොන්දේසි වලට යමක් එකතු කිරීමට, වෙනස් කිරීමට හා ඉවත් කිරීමට බැංකුව අයිතිය රඳවා ගැනීම සඳහා මම එකඟ වෙමි. මෙම නීතිරීති හා කොන්දේසිවල එවැනි වෙනස් කිරීමක් වේ නම්, ලිපියක් මගින්, සහ/හෝ PERC ගිණුමට අදාළ ප්‍රකාශන පණිවුඩයක් මගින්, සහ/හෝ බැංකු පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීම මගින්, සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි ප්‍රදර්ශනය කිරීම මගින්, සහ/හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/මාධ්‍යයක් හරහා හෝ ඒවා ලබාදිය හැකිය.

23. PERC පහසුකම යටතේ වන අයිතීන්, ප්‍රතිලාභ සහ/හෝ වගකීම් සියල්ලම හෝ යම් කොටසක් හෝ ණය, සුරැකුම්පත්, හෝ වෙනත් මූල්‍ය වත්කම් සැකසීම, මිලදී ගැනීම හෝ ආයෝජනය කිරීම පිණිස විධිමත් ලෙස සම්බන්ධ වී සිටින හෝ ස්ථාපිත කරන ලද, බැංකුවෙහි ඕනෑම සමූහ කාර්යාලයකට, වෙනත් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට හෝ වෙනත් ආයතනයකට අනුයුක්ත කිරීම හෝ පැවරීම හෝ මා හට ලිඛිත දැනුම්දීමකින් යුතුව, බැංකුව විසින් සිදු කළ හැකි බවට මම එකඟ වෙමි. එවැනි අනුයුක්ත කිරීමක් හෝ පැවරීමක් දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති බලාත්මක වන දින සිට ක්‍රියාත්මක වනු ඇති අතර, **දැන්වීමෙහි දක්වා ඇති පරිදි අනුයුක්ත කළ අය / පැවරුම්ලාභියා විසින් භාර ගත් බවට උපකල්පනය කිරීමෙන් අනතුරුව**, බැංකුව එවැනි අයිතීන්, ප්‍රතිලාභ සහ/හෝ වගකීම් වලින් නිදහස් වනු ඇත. මෙම කාඩ්පත් ගිණුමෙහි කිසිදු අයිතියක්, ප්‍රතිලාභයක් හෝ බැඳීමක් කිසිදු ලෙසකින් අනුයුක්ත කිරීම හෝ පැවරීම හෝ මා විසින් සිදු නොකළ යුතුය.

24. මම/මාගේ අනුප්‍රාප්තිකයන් හෝ පැවරුම්ලාභීන් මෙම ලියවිල්ලෙන් බැඳී සිටීමට මම එකඟ වෙමි.

25. මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකාවෙහි නීතිවලට අනුව බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු අතර, නඩු කටයුතු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි අධිකරණවලට ඉදිරිපත් කළ යුතු වන නමුත්, බැංකුව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන්නේ නම්, නඩු කටයුතු ශ්‍රී ලංකාවේ වෙනත් යම් අධිකරණයක් හෝ වෙනත් යම් රටක හෝ අධිකරණ කලාපයක වෙනත් ඕනෑම අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී එකී අධිකරණවලට අදාළ වන නීතිය අදාළ කරගනු ලැබිය යුතු අතර, එවැනි වෙනත් යම් අධිකරණ සඳහා සහ වෙනත් යම් නෛතික ආයතන සඳහා දරන ලද නෛතික පිරිවැය අධිකරණ ගාස්තු, සහ නීතීඥ ගාස්තු මාගේ ණයගැතිභාවය සඳහා එකතු කරනු ලැබිය යුතු බවට මා එකඟ වෙමි.

26. ඉහත දී ඇති තොරතුරු සත්‍ය සහ සම්පූර්ණ වන බවට ද, මෙම PERC පහසුකම ප්‍රදානය කිරීමට අදාළ ව 20....... ක් වූ .................... මස .......... දින නිකුත් කරන ලද නීතිරීති හා කොන්දේසි මා විසින් කියවා, තේරුම්ගෙන පිළිගත් බවට මම තහවුරු කරමි.

27. මාසික පදනමින් කිසියම් වාරික ගෙවීමක් ගෙවීමට නියමිතව හිඟව පවතින්නේ නම්, ගෙවීමට නියමිතව හිඟව පවතින වාරිකය/වාරික සහ ගෙවීම් පැහැර හැරීමේ පොලී වටිනාකම මාගේ ද්විතීක HSBC ගිණුමට (ජංගම හෝ ඉතුරුම් ගිණුම) හෝ වේතන ගිණුමට ( HSBC සමග වන මාගේ වැටුප බැර වන ගිණුම) හෝ බැර කිරීමට මා විසින් බැංකුව වෙත බලය ලබාදෙමි.

28. සම්බන්ධයෙන් වර්තමානයේ බලපැවැත්වෙන හා කලින් කලට සංශෝධනය කෙරෙනු ඇති නීතිරීති ද ඇතුළුව නමුත්, ඊට සීමා නොවී, ශ්‍රී ලංකාවේ නීතිරීති සහ රෙගුලාසි වලින් බැඳී සිටීමට මා විසින් එකඟව භාරගනිමි.

29. HSBC සමග පවත්වාගෙන යනු ලබන මාගේ ගිණුම/ සියලු ගිණුම් වල තැන්පත් කරන ලද වත්කම් සහ/හෝ මුදල් සම්බන්ධයෙන් මෙන්ම, එකී වත්කම් සහ/හෝ මුදල් මගින් උත්පාදනය කරනු ලබන ආදායම් සහ ලැබීම් සම්බන්ධයෙන්, කලින් කලට පවත්නා අදාළ නීතිරීති සහ රෙගුලාසි අනුව අවශ්‍ය කෙරෙන ආකාරයට, අදාළ සියලු බලධාරී බදු අධිකාරීන් වෙත මා විසින් වාර්තා කර ඇති බව සහ ඉදිරියට ද වාර්තා කරනු ලබන බවට මෙන්ම මම තහවුරු කරමි.

තොරතුරු හෙළිදරව් කිරීම

30. බැංකුව විසින් **පත් කරන ලද ඕනෑම තෙවැනි පාර්ශ්වයේ සේවාසපයන්නකු වෙත හෝ HSBC සමූහයේ ඕනෑම කාර්යාලයකට,** PERC පහසුකම සම්බන්ධයෙන් යම් ලැදියාවක් ලබන හෝ අවදානමක් භාර ගනු ලබන ඕනෑම පාර්ශ්වයක් වෙත, රජයේ ආයතන සහ/හෝ නියාමකයන් වෙත බැංකුවට සුදුසු යැයි හැඟෙන පරිදි, මා පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම සඳහා මා විසින් බැංකුව වෙත බලය පවරමි. බැංකුව සමඟ තවදුරටත් මා විසින් PERC පහසුකම/පහසුකම් පවත්වාගෙන නොයන අවස්ථාවන් හි දී ද මෙකී බලය ලබාදීම බලාත්මක වේ.

31. PERC පහසුකම පිළිබඳ නීතිරීති සහ කොන්දේසි මා විසින් සම්පූර්ණයෙන් කියවා තේරුම් ගත් බවත්, ඒ යටතේ වන බැඳීම්, වගකීම් සහ අයිතීන් පිළිබඳව මම දැනුවත් බවත්, ඉහත සඳහන් නීතිරීති සහ කොන්දේසි මා විසින් පිළිගන්නා බවත් මම පිළිගනිමි.

32. අවශ්‍ය කෙරෙන තොරතුරු පිටු අංක 1 සිට 7 දක්වා මා විසින් සම්පූර්ණ කරන ලද අතර එය සනාථ කරමින් ඒ එක් එක් පිටුවෙහි මාගේ කෙටි අත්සන නොයෙදූ නමුදු, මෙම අයදුම්පතෙහි අඩංගු සම්පූර්ණ කරුණු ආවරණය කෙරෙන පරිදි මා විසින් මෙම පිටුවෙහි මාගේ සම්පූර්ණ අත්සන යොදන ලද බව මම වැඩිදුරටත් තහවුරු කරමි.

**කාඩ්පත් හිමියාගේ තෘප්තිමත් භාවය පිළිබඳ ප්‍රතිචාරය**

| | |
|---|---|
| **ප්‍රධාන කාර්යාලය** | 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 |

**ශාඛා**

| | |
|---|---|
| බම්බලපිටිය | 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04 |
| නුගේගොඩ | 171, නාවල පාර, නුගේගොඩ |
| මහනුවර | 27, හරස් වීදිය, මහනුවර |
| පැලවත්ත, | 418, පන්නිපිටිය පාර, පැලවත්ත |
| යුනියන් පෙදෙස | 163, යුනියන් පෙදෙස, කොළඹ 02 |
| මීගමුව | 186, කොළඹ පාර, මීගමුව |
| මොරටුව | 198, ගාලු පාර, ඉඩම, මොරටුව |
| යාපනය | 145, කන්කසන්තුරෙයි පාර, යාපනය |

ඔබ වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ අපගේ සැලසුම් මගින් ඔබගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම්, කරුණාකර පහත දැක්වෙන විකල්පයන්ගෙන් එකක් ඔස්සේ වහාම අප අමතන්න.

- පාරිභෝගික විසඳුම් සමග සම්බන්ධ වන්න. customersolutions@hsbc.com.lk වෙත ඔබගේ ගැටලු යොමු කරන්න
- අප වෙත ලියන්නː කළමනාකරු, පාරිභෝගික අත්දැකීම්, පාරිභෝගික බැංකුකරණ හා වත්කම් හා පුද්ගලික බැංකුකරණ, HSBC, අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන්වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය - ශ්‍රී ලංකාව, 143ඒ, වජිර පාර, කොළඹ 5.
- දුරකථනː 94 112 595 625
- ෆැක්ස්ː + 94 112 595 624
- විද්‍යුත් තැපැලː info@financialombudsman.lk
- වෙබ් අඩවියː www.financialombudsman.lk

වැඩි විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න.

මෙකී නීතිරීති සහ කොන්දේසි සම්බන්ධයෙන් සිංහල සහ දමිළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට ඉංග්‍රිසි භාෂා පාඨය බලපැවැත්වෙන බවට ගනුදෙනුකරු තහවුරුකර එකඟවෙයි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා යනු ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණය යටතේ වන බලයලත් වාණිජ බැංකුවකි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලදී.

**HSBCPERCMAR2025 (S)**